'ස්වභාවික බව' සහ 'ශිෂ්ඨ සම්පන්න බව' (සංස්කෘතිකකරණය) අතර ප්‍රතිවිරුද්ධත්වය පිළිබඳ ඇති සම්පූර්ණ සංකල්ප පද්ධතියම සකස්වී ඇත්තේ, මෙම ප්‍රතිවිරුද්ධ සංකල්ප වල උත්පත්තියට තුඩු දුන් සාධකය අමතක කොට දැමීමට ඉඩ දෙන ආකාරයට යයි අපට එක අතකින් පැවැසිය හැකිය. මේ සාධකය නම් 'ව්‍යභිචාරය' තහනම් කිරීමයි. (ව්‍යභිචාරය තහනම් කිරීම යන්නෙන් මෙහිදී ඩෙරිඩා නියෝජනය කරන්නේ සංස්කෘතිකකරණයයි)

ඇත අතීතයේදී 'ව්‍යභිචාරය' (කිට්ටු නෑයින් අතර ලිංගික සේවනය) සමාජය තුළ පැතිර පැවැති බවත්, පසුව ඇති වූ සංස්කෘතිකකරණයේ විපාකයක් ලෙස එය (ව්‍යභිචාරය) සමාජය තුළ තහනම් වූ බවත් සාමාන්‍යයෙන් පවතින පිළි ගැනීමයි. මෙම පිළිගැනීම මත, එනම් ව්‍යභිචාරය ස්වභාවික බවත්, එය තහනම් කිරීම සංස්කෘතිකත්වය බවත් යන බෙදීම මත බිහිවූ දැවැන්ත අදහස් උදහස්, මති මතාන්තර, දර්ශනවාද පද්ධතියක්ම අප අතර වෙයි. ඒ අනුව ව්‍යභිචාරය අපේ අතීත උරුමයයි, එය තහනම් කිරීම වූ කලී එම උරුමයට තර්ජනය කරන කෘත්‍රිම අභියෝගයකියි යන්න සාමාන්‍යයෙන් පවතින පිළිගැනීමයි. ලිංගිකත්වය නිදහසේ භුක්ති විඳිමින් අතීත ස්වභාවිකත්වය දිගේ එන මිනිසා එකවරම අර ස්වභාවිකත්වයට අභියෝග කරන 'ව්‍යභිචාරය තහනම් කිරීම' (සංස්කෘතිකකරණය) නැමැති සිද්ධියට මුහුණ දෙයි.

ඩෙරිඩා අදහස් කරන්නේ 'අතීත ස්වභාවිකත්වය' දිගේ එන මිනිසාට හදිසියේ 'සංස්කෘතිකකරණය' නැමැති තර්ජනයට මුහුණ දෙන්ට සිදුවිය යන මේ සාමාන්‍ය පිළිගැනීම, එම සංකල්ප පද්ධතියේ දෝෂයක, නැතිනම් අතපසු වීම කිරීමක ප්‍රතිඵලයක් බවයි. ඔහු කියන්නේ අතීත ස්වභාවිකත්වය දිගේ එන මිනිසාට හදිසියේ සංස්කෘතිකකරණය හමු වූ බව නොව 'අතීත ස්වභාවිකත්වය' කියන සංකල්පය නිර්මාණය කරන ලද්දේම සංස්කෘතිකකරණය (මෙහිදී ව්‍යභිචාරය තහනම් කිරීම) විසින් බවයි. හඳුනාගැනීමට මිනිසාට මිනුම් දඬුවක් නොමැති හෙයිනි. ස්වභාවිකත්වය පිළිබඳ සංකල්පය නිර්මාණය කළේම 'සංස්කෘතිකකරණය' විසින් වන හෙයින්, සංස්කෘතිකකරණය යනු ස්වභාවිකත්වයට පසු එළඹුනු අවස්ථාවක් නොව, ඊට කලින්ම පැවැති අවස්ථාවක් ලෙස ඩෙරිඩා මේ තත්ත්වය සංකල්පගත කරයි.

මෙය තවත් විදියකට කියතොත්, වර්තමානය යනු ඉතිහාසයේ විකාශනයෙහි නිර්මාණයක්ය යන අදහස බිහිවී ඇත්තේ, ඉතිහාසය යනු